# ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
# காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
# LAND COMMISSIONER GENERAL'S DEPARTMENT

"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය, 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
"மிஹிகத்த மெதுர", காணிச் செயலகம், 1200/6, இராஜமல்வத்த வீதி, பத்தரமுல்ல.
"Mihikatha Medura", Land Secretriat,1200/6, Rajamalwatta Road, Battaramulla.

☎ 011 279 740(
🖷 011 286 4051


මගේ අංකය / எனது இல / My No. L2/1/89/චක්‍රලේඛ/2022 ඔබේ අංකය / உமது இல / Your No දිනය / திகதி / Date 2022.05. 25

චක්‍රලේඛ අංක - **2022/05**

**ඉඩම් කොමසාරිස්වරු (අන්තර් පළාත්/ පළාත්)**

**ප්‍රාදේශීය ලේකම්වරු**

**සහකාර ඉඩම් කොමසාරිස්වරු**

**<u>ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ආදායම් කාණ්ඩ සංශෝධනය කිරීම</u>**

ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ඉඩම් බැහැර කිරීම සඳහා ඉඩම් කච්චේරි මගින් සුදුසු පුද්ගලයින් තෝරා ගැනීමේදී නිර්ණායකයන් ලෙස භාවිතා කරනු ලබන එම පුද්ගලයන්ගේ ආදායම් කාණ්ඩය සංශෝධනය කිරීමට ක්‍රියාකර ඇත.

02. ඒ අනුව 2022.01.15 දිනැති අංක 2262/50 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පල කරනු ලැබූ හා 2022.02.07 දිනැති අංක 2266/05 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් නිවැරදි කරනු ලැබූ සංශෝධිත ආදායම් කාණ්ඩ පිළිබඳ ඉඩම් රෙගුලාසි 2022.03.23 දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් සම්මත කර ඇත.

03. එබැවින් සංශෝධිත ආදායම් කාණ්ඩ අනුව සුදුසු පුද්ගලයන් තෝරාගැනීම සිදු කරන ලෙස කාරුණිකව දන්වන අතර ගැසට් නිවේදනයේ පිටපතක් මේ සමඟ අමුණා ඇති බව වැඩිදුරටත් දන්වමි.

**කේ.ඩී. බන්ඩුල ජයසිංහ**
ඉඩම් කොමසාරිස් ජනරාල්

පිටපත් :

1. ජනාධිපති ලේකම්, ජනාධිපති ලේකම් කාර්යාලය - කරු. දැ.ගැ.ස
2. ලේකම්,ඉඩම් අමාත්‍යාංශය - කරු.දැ.ගැ.ස
3. ලේකම්, ස්වදේශ කටයුතු අමාත්‍යංශය - කරු.දැ.ගැ.ස
4. විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය - කරු. දැ.ගැ.ස
5. මහ බැංකු අධිපති, ශ්‍රී ලංකා මහ බැංකුව - කරු. අනුමත බැංකු හා මූල්‍ය ආයතන දැනුවත් කිරීම සඳහා
6. සර්වේයර් ජනරාල්, මිනින්දෝරු දෙපාර්තමේන්තුව - කරු. දැ.ගැ.ස
7. රෙජිස්ට්‍රාර් ජනරාල්, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව - කරු. සියලුම ඉඩම් රෙජිස්ටාර්වරු දැනුවත් කිරීම සඳහා
8. අධ්‍යක්ෂ ජනරාල්, වාරිමාර්ග දෙපාර්තමේන්තුව - කරු අ.ක.ස
9. සියලුම දිස්ත්‍රික් ලේකම්වරු - කරු. අ.ක.ස.
10. අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය - කරු. අ.ක.ස.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2262/50 - 2022 ජනවාරි මස 15 වැනි සෙනසුරාදා - 2022.01.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

ඉඩම් සංවර්ධන ආඥාපනත

1969 අංක 19 දරන පනතෙන්, 1981 අංක 27 දරන පනතෙන්, 1993 අංක 22 දරන පනතෙන්, 1995 අංක 09 සහ 1996 අංක 20 දරන පනතෙන් සංශෝධිත (464 වන අධිකාරිය වූ) ඉඩම් සංවර්ධන ආඥපනතේ 155 හා 156 වගන්ති යටතේ, ඉඩම් අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ රෙගුලාසි.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

"මිහිකත මැඳුර",
ඉඩම් මහලේකම් කාර්යාලය,
අංක 1200/6, රජමල්වත්ත පටුමඟ,
බත්තරමුල්ල.

රෙගුලාසි

(1) මෙම රෙගුලාසි 2021 ඉඩම් සංවර්ධන රෙගුලාසි යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) 2014 ජනවාරි මස 03 වැනි දින සාදනු ලැබූ 2013 ඉඩම් සංවර්ධන රෙගුලාසි පහත ආකාරයට වැඩිදුරටත් සංශෝධනය කරනු ලැබේ.

(3) 2014 ජනවාරි මස 03 වැනි දින සාදනු ලැබූ 2013 ඉඩම් සංවර්ධන නියෝග 3 හි "අ", "ආ", "ඇ" සහ "ඈ" ඡේද වෙනුවට පහත ඡේද ආදේශ කිරීමෙන් එනම්,

(අ) "ගොවියා" යන්නෙන් යම් ඉඩමක් තමා විසින් වගා කිරීමට කැමැත්ත ඇත්තා වූ ද, නැතහොත් තම පවුලේ යම් සාමාජිකයෙකු ලවා වගා කරවා ගැනීමට කැමැත්ත ඇත්තා වූ ද වගා කරවා ගැනීමට හැකියාව ඇත්තා වූ ද කෘෂිකර්මයට සම්බන්ධ වෙනත් ආර්ථික කටයුත්තක නියැලී සිටියා වුවත් තමාගේ හා තම පවුලේ ජීවනෝපාය සඳහා එම ඉඩම අවශ්‍ය වන්නාවූ පවුල් ඒකකයේ වාර්ෂික ආදයම රුපියල් තුන් ලක්ෂයකට (රු. 300,000) නොවැඩි වන්නාවූ ද තැනැත්තෙකු අදහස් වේ.

(ආ) "උගත් තරුණයා" යන්නෙන් අවිවාහක, වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 30 ට නොවැඩි අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ දක්වා අධ්‍යාපන සුදුසුකම් ලබා ඇත්තා වූ ද ගොවියෙකුගේ දරුවකු වන්නා වූ හෝ අඩු ආදයම් ලබන කාණ්ඩයේ තැනැත්තෙකු අදහස් වේ.

(ඇ) "අඩු ආදයම් ලබන කාණ්ඩයේ තැනැත්තෙකු" යන්නෙන් ;

(i) ඒ තැනැත්තා අවිවාහකයෙකු නම්, ඉහතින්ම වූ වර්ෂය සඳහා ඔහු හෝ ඇය රුපියල් හාර ලක්ෂ අසූ දහසකට (රු. 480,000) වැඩි නොවන්නා වූ, *නැතහොත්*

(ii) ඒ තැනැත්තා විවාහකයෙකු නම්, ඉහතින්ම වූ වර්ෂය සඳහා ඔහු හෝ ඇය රුපියල් හය ලක්ෂයකට (රු. 600,000) වැඩි නොවන්නා වූ මුළු ආදයමක් ලබන තැනැත්තෙකු බව අදහස් වේ.

(ඈ) "වැඩි ආදයම් ලබන කාණ්ඩයේ තැනැත්තෙකු" යන්නෙන්,

(i) ඒ තැනැත්තා අවිවාහකයෙකු නම්, ඉහතින්ම වූ වර්ෂය සඳහා ඔහු හෝ ඇය රුපියල් හාර ලක්ෂ අසූ දහසකට (රු. 480,000) වැඩි එහෙත් රුපියල් හය ලක්ෂ හැට දහසකට (රු. 660,000) වැඩි නොවන්නා වූ, *නැතහොත්*

(ii) ඒ තැනැත්තා විවාහකයෙකු නම්, ඉහතින්ම වූ වර්ෂය සඳහා ඔහු හෝ ඇය රුපියල් හය ලක්ෂයකට (රු. 600,000) වැඩි එහෙත් රුපියල් හත් ලක්ෂ විසි දහසකට (රු. 720,000) නොවැඩි වූ මුළු ආදයමක් ලබන තැනැත්තෙකු බව අදහස් වේ.

* මෙහිදී මධ්‍යම පන්තික අයවලුන් ද අඩු ආදයම් හා වැඩි ආදයම් ගණයට වැටේ.

EOG 01- 0158

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2266/5 - 2022 පෙබරවාරි මස 07 වැනි සඳුදා - 2022.02.07**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් සංවර්ධන ආඥාපනත - රෙගුලාසි**

අංක 2251/48 හා 2021.10.28 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 1A පිටුවෙහි සිංහල හා දෙමළ භාෂාවලින් පළ කරන ලද මාගේ නිවේදනයෙහි,

"1969 අංක 19 දරන පනතින්, 1981 අංක 27 දරන පනතින්, 1993 අංක 22 දරන පනතින්, 1995 අංක 09 සහ 1996 අංක 20 දරන පනතින් සංශෝධිත (464 වන අධිකාරය වූ) ඉඩම් සංවර්ධන ආඥාපනතේ 155 සහ 156 වගන්ති යටතේ ඉඩම් අමාත්‍යවරයා විසින් පනවනු ලබන රෙගුලාසි."

යන්න

"1969 අංක 16 දරන පනතින්, 1981 අංක 27 දරන පනතින්, 1993 අංක 22 දරන පනතින්, 1995 අංක 09 සහ 1996 අංක 20 දරන පනතින් සංශෝධිත ( 464 වන අධිකාරය වූ) ඉඩම් සංවර්ධන ආඥාපනතේ 155 සහ 156 වගන්ති යටතේ ඉඩම් අමාත්‍යවරයා විසින් පනවනු ලබන රෙගුලාසි. "

ලෙස නිවැරදි විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

2022 ජනවාරි මස 31 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 02 - 0383/1

## ශුද්ධි පත්‍රිකාව

### ඉඩම් සංවර්ධන ආඥාපනත - රෙගුලාසි

අංක 2262/50 හා 2022.01.15 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 1A පිටුවෙහි භාෂාත්‍රයෙන් පළ කරන ලද මාගේ නිවේදනයෙහි,

"1969 අංක 19 දරන පනතින්, 1981 අංක 27 දරන පනතින්, 1993 අංක 22 දරන පනතින්, 1995 අංක 09 සහ 1996 අංක 20 දරන පනතින් සංශෝධිත (464 වන අධිකාරය වූ) ඉඩම් සංවර්ධන ආඥාපනතේ 155 සහ 156 වගන්ති යටතේ ඉඩම් අමාත්‍යවරයා විසින් පනවනු ලබන රෙගුලාසි."

යන්න

"1969 අංක 16 දරන පනතින්, 1981 අංක 27 දරන පනතින්, 1993 අංක 22 දරන පනතින්, 1995 අංක 09 සහ 1996 අංක 20 දරන පනතින් සංශෝධිත ( 464 වන අධිකාරය වූ) ඉඩම් සංවර්ධන ආඥාපනතේ 155 සහ 156 වගන්ති යටතේ ඉඩම් අමාත්‍යවරයා විසින් පනවනු ලබන රෙගුලාසි."

ලෙස නිවැරදි විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

2022 ජනවාරි මස 31 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 02 - 0383/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.